පොලිස්පති චක්‍රලේඛ :2740/2022
අපරාධ චක්‍රලේඛ : 03 /2022

මගේ අංකය :
පොලිස් මූලස්ථානය
කොළඹ - 01
2022.12.27

සියලු ම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරීන් / අධ්‍යක්ෂවරුන්
: ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන්

## සංක්‍රාන්ති ලිංගිකයන් සහ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් සම්බන්ධව කටයුතු කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

"කිසිම පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේ ය." යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) අනු ව්‍යවස්ථාවේ හි සඳහන් මූලික අයිතිවාසිකමක් වේ.

එසේ වුව ද ඇතැම් අවස්ථාවල දී පොලිස් නිලධරයන් විසින් සංක්‍රාන්ති ලිංගිකයන් සහ විවිධ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් සම්බන්ධව කටයුතු කිරීමේ දී ඉහත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදනයට පටහැනිව ක්‍රියාකරන බවට යම් මත ඉදිරිපත් වී ඇත.

පසුගිය දිනෙක පොලිස් නිලධරයන්ගේ සහභාගිත්වයෙන් පැවති වැඩමුළුවක දී එහි දේශක විසින් ඉහත දක්වා ඇති තැනැත්තන් විවේචනය කිරීමේ සිදුවීමක් සම්බන්ධව ගරු අභියාචනාධිකරණය ඉදිරියේ අංක 425/2021 දරන රිට් නඩුව පවරා ඇති අතර, එම ප්‍රජාවගේ මූලික අයිතිවාසිකම් යටපත් කිරීමට එරෙහිව ශ්‍රී ලංකා පොලිසිය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා ඇත.

ගරු නීතිපති විසින් මෙම නඩුවට අදාළව අධිකරණය ඉදිරියේ කරුණු දක්වමින්, රටේ පවත්නා අපරාධ නීතිය අනුව කටයුතු කරන අතරතුර ශ්‍රී ලංකා පොලිසිය විසින් මේ සම්බන්ධව විධිමත් උපදෙස් පත්‍රිකාවක් නිකුත් කිරීමට ක්‍රියා කරන බවට සඳහන් කර ඇත.

ඒ අනුව සංක්‍රාන්ති ලිංගිකයන් හෝ විවිධ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන්ට අදාළව සිදුකරනු ලබන රාජකාරි කටයුතු වලදී පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

1. සංක්‍රාන්ති ලිංගිකයන් හෝ විවිධ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තෙකුගෙන් ලැබෙන පැමිණිලි (විශේෂයෙන් අංග චලනයෙන් හෝ වාචිකව එවැනි තැනැත්තෙකුට ශාරීරිකව හෝ මානසිකව සිදුවන පීඩා ද ඇතුළත්ව) හා එවැනි තැනැත්තෙකුට එරෙහිව ලැබෙන පැමිණිලි, අදාළ මූ.පො.ප. / ස්ථානාධිපතිවරයාගේ ඍජු අධීක්ෂණය යටතේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ ඒකකය මඟින් විමර්ශනයට ලක් කළ යුතු ය.

සත්‍ය පිටපතකි
ස්ථානාධිපති
පොලිස් නීති කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

2. එවැනි පැමිණිල්ලක් සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවුවහොත් අදාළ මූ.පො.ප. / ස්ථානාධිපති විසින් ඒ පිළිබඳව ළමා හා කාන්තා අපයෝජන විමර්ශන දිසාවේ නියෝජ්‍ය පොලිස්පති හෝ එම කොට්ඨාසයේ අධ්‍යක්ෂ වෙත හෝ දැනුම් දී, එම උපදෙස් අනුව විමර්ශන සිදු කළ යුතු ය.

3. එවැනි විමර්ශනයක් අවසන්වීමෙන් පසුව අධ්‍යක්ෂ / නීති කොට්ඨාසය වෙත ගොනු යොමුකර එම උපදෙස් අනුව නඩු පැවරීම හෝ විමර්ශන අවසන් කර ගොනුව වසා තැබීම කළ යුතු ය.

4. යම් වරදක් සම්බන්ධව සංක්‍රාන්ති ලිංගිකයෙකු හෝ විවිධ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තෙකු අත්අඩංගුවට ගතහොත් අවස්ථාවෝචිතව නිලධාරියෙකු හෝ නිලධාරිණියක විසින් විනීතභාවය පිළිබඳව නිසි සැලකිල්ලෙන් යුක්තව එම තැනැත්තා සෝදිසි කිරීම හෝ පරීක්‍ෂා කිරීම සිදුකළ යුතු ය.

5. එවැනි තැනැත්තෙකු අත්අඩංගුවේ රඳවා ගන්නා අවස්ථාවල දී අවස්ථාවෝචිතව ආරක්‍ෂක මාතාවකගේ හෝ කාන්තා නිලධාරියකගේ භාරයේ තැබිය යුතු අතර, කිසිදු අවස්ථාවක දී පොලිස් නිලධරයන් විසින් මෙවැනි තැනැත්තන් වාචිකව / කායිකව හෝ යම් ශාරීරික හෝ මානසික පීඩාවකට ලක් කිරීම හෝ අවමන් සහගත සැලකිල්ලකට ලක් කිරීම නොකළ යුතුය.

6. පුහුණු ආයතනවල පවත්වන දේශනවල දී හෝ බාහිර දේශකයන් සහභාගී කරවනු ලබන පුහුණු හෝ වැඩමුළුවල දී සංක්‍රාන්ති ලිංගිකයන් හා විවිධ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් වෙනස්කමකට හෝ කොන් කිරීමකට භාජනය වන ආකාරයේ දේශන පැවැත්වීම හෝ ප්‍රකාශ නිකුත් කිරීම නොකළ යුතු ය.

එවැනි කරුණු එම දේශනවල අන්තර්ගත නොකළ යුතු බවට දේශකයන් දැනුවත් කිරීම සහ ඉහත පරිදි කටයුතු කරන බවට වගබලා ගැනීම සෑම පුහුණු ආයතනයකම / ඒකකයකම ප්‍රධානියා ගේ වගකීම විය යුතු ය.

7. ඉහත සඳහන් කිසිම ප්‍රතිපාදනයකින් දණ්ඩ නීති සංග්‍රහයේ 365, 365අ, 365ආ හා 365ඇ වගන්ති අනුව කටයුතු කිරීම වැළැක්වීම සිදු නොකරන අතර, එසේ කටයුතු කිරීම සඳහා විධිමත් පැමිණිල්ලක් හෝ සාධාරණ කරුණු නොමැතිව මෙවැනි තැනැත්තන් අත්අඩංගුවට ගැනීම හෝ ඔවුන්ට එරෙහිව නීතිමය වශයෙන් කටයුතු කිරීමේ අරමුණින් ගුද හෝ යෝනි පරීක්‍ෂාවන් සිදු කිරීම හෝ කිසිසේත් නොකළ යුතු ය.

8. යම් අපරාධ අරමුණකින් තොරව සංක්‍රාන්ති ලිංගිකයෙකු හෝ විවිධ ලිංගික විපර්යාසයන්ට ලක්ව ඇති තැනැත්තෙකු තම ලිංගික විපර්යාසයන් සමාජයට වසන් කිරීම හේතු කොටගෙන පමණක්, එවැනි තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීම කිසිදු අවස්ථාවක දී සිදු නොකළ යුතු ය.

සත්‍ය පිටපතකි

ස්ථානාධිපති
පොලිස් නීති කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

9. උපත්පාලන පෙති, කරල් හෝ කොණ්ඩම් ළඟ තබා ගැනීම වරදක් නොවන බැවින්, එසේ ළඟ තබා ගැනීමේ හේතුව මත පමණක්, කිසිදු තැනැත්තෙකු ප්‍රශ්න කිරීමකට ලක් කිරීම හෝ අත්අඩංගුවට ගැනීම නොකළ යුතු අතර, එම හේතුව මත පමණක් එවැනි තැනැත්තෙකුට එරෙහිව "අයාල ආඥා පනත" යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ කටයුතු කිරීම ද නොකළ යුතු ය.

සංක්‍රාන්ති ලිංගිකයන් හෝ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් සමාන අයිතිවාසිකම් හා සම සැලකිල්ලකට අයිතිවාසිකම් ඇති පිරිසක් බැවින් නීතිය ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය සහ නීතිය පසිඳලීම සිදු කිරීමේ දී කිසිදු වෙනස්කමකට භාජනය නොවන පරිදි කටයුතු කළ යුතු වේ.

එබැවින් ඔවුන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය විසින් නිසි ක්‍රියාමාර්ග ගන්නා බවට වග බලා ගැනීම සඳහා සහ එසේ සිදු කිරීමට සෑම නිලධරයකුම පෙළඹවීම සඳහා මෙම උපදෙස් ඇතුළත් පොලිස්පති චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව ඔබ යටතේ රාජකාරි කරන සියලු නිලධරයන් දැනුවත් කර, සංක්‍රාන්ති ලිංගිකයන් හෝ ලිංගික විපර්යාසයන්ට ලක් වූ තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙසට ක්‍රියා කළ යුතු ය.

කෙසේ වෙතත්, මෙම චක්‍රලේඛයේ කිසිදු ප්‍රතිපාදනයක් මඟින් දණ්ඩ නීති සංග්‍රහයේ හා /හෝ වෙන යම් ලිඛිත නීතියක අපරාධ වරදක් සම්බන්ධයෙන් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට ශ්‍රී ලංකා පොලීසියට හා / හෝ පොලිස් නිලධරයන් හට ඇති නෛතික හැකියාවට බාධාවක් සිදුවන බවට නොසැලකිය යුතු බව ද අවධාරණය කරමි.

සී.ඩී. වික්‍රමරත්න
පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01

සත්‍ය පිටපතකි

ස්ථානාධිපති
පොලිස් නීති කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පිටපත : ගොනුවට
මං/-